සියලුම හිමිකම් ඇවිරිණි]
All Right Reserved]

Learning Resource Centre

දී මැසනොද් විද්‍යාලය, කඳාන
De Mazonod Collage, Kandana

අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ
පළමු වාර පරීක්ෂණය - 2016

2016 A/L

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය I<br>**Business Studies I** | 13 ශ්‍රේණිය<br>**Grade 13** | කාලය<br>පැය 02 |

❖ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

24/02/2016

01. වුවමනා,

(1) සීමිත ය (2) විවිධ ය (3) අත්‍යවශ්‍ය ය (4) ප්‍රාථමික ය (5) පොදු ය

02. පහත සඳහන් රටවල් අතුරෙන් එක් රටක් ආසියාතික (ASEAN) සංවිධානයට අයත් නොවේ. ඒ රට කුමක් ද?

(1) මැලේසියාව (2) පිලිපීනය (3) ශ්‍රී ලංකාව (4) සිංගප්පූරුව (5) තායිලන්තය

03. ව්‍යාපාර ආචාර ධර්මයකි. (a business ethic)

(1) සාධාරණව හා අවංකව තරග කිරීම
(2) මානව හිමිකම් ආරක්ෂා කිරීම
(3) සේවක අයිතිවාසිකම් සුරැකීම
(4) පරිසරය සුරැකීම
(5) සමාජ සුභසාධනය

04. එකම ස්වරූපයේ ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින සමාගම් දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ වීම

(1) සිරස් සංයෝජනයකි
(2) තිරස් සංයෝජනයකි
(3) විෂම සංයෝජනයකි
(4) වෙළෙඳපොළ පුළුල් කිරීමේ සංයෝජනයකි
(5) නිෂ්පාදිතය පුළුල් කිරීමේ සංයෝජනයකි

05. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන නෝට්ටු හා කාසි හැඳින්වුයේ,

(1) සීමිත වලංගු මුදල් ලෙස ය
(2) අසීමිත වලංගු මුදල් ලෙස ය
(3) ආසන්න මුදල් ලෙස ය
(4) නියෝග මුදල් ලෙස ය
(5) පූර්ණ මුදල් ලෙස ය

06. නෛතික තත්ත්වය අනුව ගනුදෙනු කළ හැකි ලියවිල්ලකි,

(1) විනිමය බිල
(2) කොටස් බලපත්‍රය
(3) ලාභාංශ බලපත්‍රය
(4) බැංකු අණකරය
(5) මුදල් ඇණවුම

07. පහත වගුවේ X තීරුවේ පරිසර වර්ගීකරණය ද Y තීරුවේ පරිසර බලවේග ද දක්වා ඇත.

| X | Y |
|---|---|
| A. අභ්‍යන්තර පරිසරය | 1. සේවකයෝ |
| B. ආසන්න පරිසරය | 2. ගනුදෙනුකරුවෝ |
| C. සාර්ව පරිසරය | 3. සංවිධාන ව්‍යුහය |
| | 4. තාක්ෂණය |
| | 5. සමාජ හා සංස්කෘතික |
| | 6. විභව ව්‍යාපාරිකයෝ |

X හා Y තීරුවල දක්වෙන පද නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A1 හා 2 / B3 හා 4 / C5 හා 6
(2) A1 හා 2 / B3 හා 5 / C4 හා 6
(3) A1 හා 3 / B2 හා 5 / C3 හා 5
(4) A1 හා 3 / B2 හා 5 / C4 හා 6
(5) A1 හා 3 / B2 හා 6 / C4 හා 5

08. අන්තර්ජාතික වශයෙන් පිළිගෙන ඇති පාරිභෝගික අයිතිවාසිකම් ඇතුළත් කාණ්ඩ කිහිපයක් පහත දක්වේ. මේවා අතුරින් ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයකු වූ ජෝන් එෆ්. කෙනඩි විසින් ප්‍රකාශයට පත් කරන ලද පාරිභෝගික අයිතිවාසිකම් හතර පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න

(1) ආරක්ෂාව සලසා ගැනීම, තෝරා ගැනීම, වන්දි ලබා ගැනීම, පාරිභෝගික අධ්‍යාපනය
(2) තෝරා ගැනීම, තොරතුරු දැන ගැනීම, වන්දි ලබා ගැනීම, සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීම.
(3) ආරක්ෂාව සලසා ගැනීම, තොරතුරු දැන ගැනීම, තෝරා ගැනීම, සවන් යොමු කර ගැනීම
(4) තෝරා ගැනීම, සවන් යොමු කර ගැනීම, වන්දි ලබා ගැනීම, පාරිභෝගික අධ්‍යාපනය
(5) ආරක්ෂාව සලසා ගැනීම, තොරතුරු දැන ගැනීම, තෝරා ගැනීම, වන්දි ලබා ගැනීම

09. සීමාසහිත සමාගම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සීමාසහිත පෞද්ගලික සමාගමක අවම කොටස් හිමියන් සංඛ්‍යාව එකකි. උපරිමය සීමාවක් නැත.
(2) වෙනත් රටක සංස්ථාගත කර ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු කරන සමාගමක් අක්වෙරළ සමාගමක් ලෙස හැඳින්වේ.
(3) සීමාසහිත පෞද්ගලික සමාගමක අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව එකකි. උපරිමය සංඛ්‍යාව හතකි.
(4) සංස්ථාගත කිරීමේ සහතිකය ලබා ගැනීමෙන් පසු වෙළඳ කටයුතු ඇරඹිය හැක්කේ සීමාසහිත පෞද්ගලික සමාගම්වලට පමණි.
(5) සීමාසහිත පොදු සමාගමක අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව දෙදෙනෙකි. උපරිමය සීමාවක් නැත.

10. ව්‍යාපාර සංවිධාන කිහිපයක් සහ ඒවාට අදාළ කරුණු කිහිපයක් පහත වගුවේ දක්වේ.

| ව්‍යාපාර සංවිධානය | අදාළ කරුණු |
|---|---|
| A. රාජ්‍ය සංස්ථා | 1. සෑම සාමාජිකයකුටම ඔහු දරන කොටස් ප්‍රමාණය අනුව ඡන්ද බලය හිමිවේ |
| B. හවුල් ව්‍යාපාර | 2. රජයේ සෘජු පාලනයට යටත් වේ |
| C. සමුපකාර සමිති | 3. පොදු හෝ විශේෂ පාර්ලිමේන්තු පනත් යටතේ සංස්ථාපිත කෙරේ |
| D. සීමා සහිත පොදු සමාගම් | 4. එක් සාමාජිකයකුට හිමි වන්නේ එක් ඡන්දයක් පමණි |
| E. රාජ්‍ය දෙපාර්තමේන්තු | 5. 1918 ව්‍යාපාර නාම ආඥා පනත බලපායි |

ව්‍යාපාර සංවිධාන හා අදාළ කරුණු නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 2 , B - 5 , C - 1 , D - 3 , E - 4
(2) A - 3 , B - 4 , C - 1 , D - 5 , E - 2
(3) A - 2 , B - 4 , C - 5 , D - 1 , E - 3
(4) A - 3 , B - 5 , C - 4 , D - 1 , E - 2
(5) A - 3 , B - 5 , C - 1 , D - 4 , E - 2

11. මුදල් යනු කුමක් ද? යන ප්‍රශ්නයට සිසුන් පස් දෙනෙකු දෙන ලද පිළිතුරු පහත දක්වේ. ඒවා අතුරින් වඩාත් නිවැරදි පිළිතුර කුමක් ද?

(1) ගෙවීම් සඳහා භාවිත කරන රුපියල් හා සත
(2) ගෙවීම සඳහා යොදා ගන්නා ඕනෑම දෙයක්
(3) දේශීය හා විදේශීය ගනුදෙනුවලදී පිළිගන්නා ඕනෑම දෙයක්
(4) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන නෝට්ටු හා කාසි
(5) හුවමාරු මාධ්‍යයක්, වටිනාකමේ මිම්මක් හා වටිනාකමේ සන්නිධියක් වශයෙන් කටයුතු කරන ඕනෑම දෙයක්

24.02.2016
ව්‍යාපාර අධ්‍යයනය I
13 ශ්‍රේණිය

12. පහත වගුවේ X තීරුවේ ප්‍රධාන මූල්‍ය ආයතන වර්ග ද Y තීරුවේ මූල්‍ය ආයතන කිහිපයක නම් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. බලපත්‍රලාභී වාණිජ බැංකු<br>B. බලපත්‍රලාභී විශේෂිත බැංකු<br>C. ලියාපදිංචි මූල්‍ය සමාගම් | 1. නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුව<br>2. රජරට සංවර්ධන බැංකුව<br>3. ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව<br>4. ජාතික ඉතිරි කිරීමේ බැංකුව<br>5. එල්. බී. ෆිනෑන්ස් ලිමිටඩ්<br>6. සණස ඩිවලොප්මන්ට් බැංකුව<br>7. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්<br>8. මහජන බැංකුව<br>9. කොමර්ෂල් ක්‍රෙඩිට් ලිමිටඩ් |

Y තීරුවේ මූල්‍ය ආයතන X තීරුවේ වර්ග වලට අනුව ගැළපූ විට ලැබෙන නිවැරදි කාණ්ඩය කුමක් ද?

(1) A - 1, 2, 5 / B - 3, 4, 7 / C - 6, 8, 9
(2) A - 1, 3, 8 / B - 2, 4, 6 / C - 5, 7, 9
(3) A - 2, 3, 8 / B - 4, 6, 9 / C - 1, 5, 7
(4) A - 4, 6, 8 / B - 2, 5, 7 / C - 1, 3, 9
(5) A - 2, 4, 8 / B - 1, 3, 6 / C - 5, 7, 9

13. උපුල් තම මෝටර් රථය රු මිලියන 3 කට රක්ෂණය කර ඇත. ඔහුගේ මෝටර් රථය හඳුනා නොගත් පුද්ගලයකු විසින් සොරකම් කරන ලදි. රක්ෂණ සමාගම රු මිලියන 3 ක් ගෙවා උපුල්ගේ වන්දිය පියවන ලදි. දින කිහිපයකට පසු රක්ෂණ සමාගම විසින් මෝටර් රථය සොයාගනු ලැබූ අතර එය රු මිලියන 3.5 ක වෙළෙඳපොළ වටිනාකමට වෙන්දේසි කරන ලදි. (වෙන්දේසිකරුගේ ගාස්තුව රුපියල් 150 000 කි) ඉන් පසු රක්ෂණ සමාගම විසින් කළ යුතු වන්නේ,

(1) රු මිලියන 3 ක් තබාගෙන ඉතිරි මුදල උපුල්ට ලබා දීමය
(2) රු මිලියන 3 සහ වියදම් වූ මුදල තබාගෙන ඉතිරි මුදල උපුල්ට ලබා දීම ය
(3) වෙන්දේසිකරුගේ වියදම ගෙවා ඉතිරි මුදල තබා ගැනීම ය
(4) මෝටර් රථය මිල දී ගත් තැනැත්තාට ඉතිරි මුදල ලබා දීම ය
(5) ඉතිරි මුදල රජයට ගෙවීම ය

14. කොළඹ වරායේ සිට සපුගස්කන්ද තෙල් පිරිපහදු මධ්‍යස්ථානය වෙත ඉන්ධන ප්‍රවාහනය කිරීමට වඩාත් සුදුසු පරිවහන මාධ්‍යයන් වන්නේ,

(1) ට්‍රක් රථ, උමං මාර්ග සහ දුම්රිය වේ.
(2) දුම්රිය, නැව් සහ කුඩා අහස් යානා වේ.
(3) නල මාර්ග, බවුසර් සහ කුඩා අහස් යානා වේ.
(4) නැව්, දුම්රිය සහ ට්‍රක් රථ වේ.
(5) නල මාර්ග, දුම්රිය සහ බවුසර් වේ.

15. බලතල (අධිකාරිය) පැවරීම තුළින් ඇති නොවන ප්‍රතිඵලය දක්වෙන ප්‍රකාශය තෝරන්න.

(1) ආසන්නතම ප්‍රධානියාගේ වැඩ ප්‍රමාණය අඩුවීම.
(2) ආසන්නතම ප්‍රධානියාගේ පුහුණුව හා සංවර්ධනය වැඩි වීම.
(3) යටත් සේවකයන්ගේ වැඩ ප්‍රමාණය අඩු වීම.
(4) අභිප්‍රේරණය වූ සේවකයින් ඇති වීම.
(5) වෘත්තීය සංවර්ධනයට යටත් සේවකයා සූදානම් කිරීම.

16. සැලසුම් කිරීමේදී සැලකිල්ලට ගත යුතු දෑ මොනවා දැයි විමසන ලද ප්‍රශ්නයට ශිෂ්‍යයින් කිහිපදෙනෙකු සැපයූ පිළිතුරු පහත පරිදි වේ.

A - ප්‍රායෝගික බව
B - නම්‍යශීලී බව
C - අවස්ථානුකූල සැලසුම් කිරීම
D - නිශ්චිත කාල පරාසයක් සඳහා වීම.
E - සම්පත් ලබා ගත හැකි බව

ඉහත කරුණුවලින්, සැලසුම් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු දෑ වන්නේ,

(1) A පමණකි. (2) A හා B පමණකි. (3) A,B හා C පමණකි.
(4) A,B,C හා D පමණකි. (5) ඉහත සඳහන් සියලුම කරුණු ය.

17. පහත සඳහන් කරුණු වලින් නිෂ්පාදන ක්‍රියාවලි තීරණ වලට බලපෑමක් ඇති නොකරන සාධකය වන්නේ,
(1) සේවකයන්ගේ පුහුණු හා නුපුහුණු බව
(2) අවශ්‍ය උපකරණ වර්ග
(3) නිපදවිය හැකි නිෂ්පාදන වර්ග
(4) සංවිධානය සතු වාහන ප්‍රමාණය
(5) භාවිත කිරීමට සිදුවන මෙහෙයුම් පිරියත සැලසුම් වර්ග

18. පහත සඳහන් දෑ අතුරෙන් වෙළෙඳ දැන්වීමක සඵලදායිතාව දැන ගැනීමට අලෙවි කළමනාකරුවකු සඳහා වඩා වැදගත් වනතොරතුරු මූලාශ්‍රය කුමක් ද?
(1) අලෙවි දත්ත
(2) අලෙවිකරණ ජාලය
(3) වෙළෙඳපොළ පර්යේෂණ
(4) අභ්‍යන්තර දත්ත සමුදාය
(5) තරගකරුවන්ගේ ප්‍රතිපෝෂණය

19. පහත දක්වෙන්නේ පටු (Narrow) හා පුළුල් (wide) පාලන අවකාශයන්හි දැකිය හැකි වාසි හා අවාසි කිහිපයකි.
A - ඉහළ මට්ටමක පාලනයක් පැවැතීම
B - කළමනාකරු ඒ ඒ පුද්ගලයන් සමඟ වඩා සමීප බවක් ඇති වීම
C - පිරිවැය අඩු වීම
D - තීරණ ගැනීම වේගවත් වීම
E - සමීප සුපරීක්ෂණයක් ඇති වීම
F - සේවක නිදහස වැඩි වී රැකියා තෘප්තිය ඉහළ යාම

ඉහත සඳහන් දෑ අතුරින් පුළුල් පාලන අවකාශයක වාසි ලෙස සැලකිය හැක්කේ,
(1) A, B හා C ය
(2) B, C හා D ය
(3) C, D හා E ය
(4) C, D හා F ය
(5) D, E හා F ය

20. ඉදි කිරීමේ ආයතනයක්, මහල් ගණනාවකින් යුක්ත සුවිශාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් ලබාගෙන ඇත. මෙම ඉදි කිරීම සඳහා වඩා උචිත පිරියත (Layout) වනුයේ,
(1) ක්‍රියාවලි පිරියතයි. (Process Layout)
(2) නිෂ්පාදිත / එකලස් කිරීමේ පිරියතයි. (Product Layout)
(3) කුටි පිරියතයි. (Cellular Layout)
(4) ස්ථාවර ස්ථානීය පිරියතයි. (Fixed position Layout)
(5) කාර්ය බද්ධ පිරියතයි. (Functional Layout)

21. අධි තාක්ෂණ කර්මාන්තශාලාවල, අවදානම් වැඩි, නීරස, නිරන්තර කළ යුතු සහ දෘඪ කාර්ය සඳහා යොදා ගන්නා, පරිගණක මගින් පාලනය කෙරෙන තාක්ෂණික ක්‍රමය හඳුන්වන්නේ කවර නමකින් ද?
(1) පරිගණක ආධාර නිර්මාණකරණය (CAD)
(2) පරිගණක අංකිත පාලනය (CNC)
(3) නම්‍යශීලී නිෂ්පාදන ක්‍රමය (FMS)
(4) පරිගණක සමෝධානික නිෂ්පාදනය (CIM)
(5) රොබෝ ක්‍රමය (Robotics)

22. අලෙවිකරුවෙක් සිය ප්‍රචාරණ, ප්‍රවර්ධන හා වෙනත් අලෙවිකරණ ප්‍රයත්නයන් යොමු කරන නිශ්චිත වෙළෙඳපොළ ඛණ්ඩය හඳුන්වනුයේ,
(1) ගැනුම්කරුවන්ගේ වෙළෙඳපොළ ලෙස ය
(2) විකුණුම්කරුවන්ගේ වෙළෙඳපොළ ලෙස ය
(3) ඉලක්ක වෙළෙඳපොළ ලෙස ය
(4) විභව වෙළෙඳපොළ ලෙස ය
(5) නිෂ්පාදිත වෙළෙඳපොළ ලෙස ය

23. පහත වගුවේ X තීරුවෙන් දක්වෙන්නේ නිෂ්පාදිතයක ජීවන චක්‍ර අදියරයන්ය. Y තීරුවෙන් දක්වෙන්නේ ඒ ඒ අදියරයන්ට ආවේණික ගති ලක්ෂණයන්ය.

| X ජීවන චක්‍ර අදියර | Y ගති ලක්ෂණ |
|---|---|
| A. හඳුන්වා දීම | 1. ලාභය ඉහළ යයි |
| B. වර්ධන | 2. මූලික නිෂ්පාදිතය විවිධත්වයට පත් කරයි |
| C. පරිණත | 3. බොහෝමයක් ප්‍රචාරණ හා ප්‍රවර්ධන අත් හරී |
| D. පරිහානි | 4. පිරිවැය ඉහළ මට්ටමක පවතී |

Y තීරුවේ ගති ලක්ෂණ X තීරුවේ ජීවන චක්‍ර අදියරයන්ට අනුව ගැළපූ විට ලැබිය හැකි නිවැරදි පිළිතුර තෝරන්න.

(1) A 1, B 2, C 3, D 4
(2) A 2, B 3, C 4, D 1
(3) A 3, B 4, C 1, D 2
(4) A 4, B 1, C 2, D 3
(5) A 4, B 1, C 3, D 2

24. ආයතනයක අග්‍ර කළමනාකරුවන් හා මධ්‍යම කළමනාකරුවන් සතුව තිබිය යුතු කුසලතා සංසන්දනය පිළිබඳව වූ පහත ප්‍රකාශ අතුරෙන් යෝග්‍යතම ප්‍රකාශය තෝරන්න.

(1) අග්‍ර කළමනාකරුවන්ට මධ්‍යම කළමනාකරුවන්ට වඩා සංකල්පමය කුසලතාවන් තිබිය යුතු අතර තාක්ෂණික කුසලතාවයන් වැඩියෙන් තිබිය යුත්තේ මධ්‍යම කළමනාකරුවන්ටය
(2) මධ්‍යම කළමනාකරුවන්ට අග්‍ර කළමනාකරුවන්ට වඩා සංකල්පමය කුසලතා හා තාක්ෂණික කුසලතා තිබිය යුතුය
(3) අග්‍ර කළමනාකරුවන්ට මධ්‍යම කළමනාකරුවන්ට වඩා තාක්ෂණික කුසලතා හා අන්තර් පුද්ගල කුසලතා තිබිය යුතුය
(4) අග්‍ර කළමනාකරුවන්ට මධ්‍යම කළමනාකරුවන්ට වඩා වැඩියෙන් අන්තර් පුද්ගල කුසලතා තිබිය යුතු අතර සංකල්පමය කුසලතා වඩා වැඩියෙන් තිබිය යුත්තේ මධ්‍යම කළමනාකරුවන්ටය
(5) අග්‍ර කළමනාකරුවන්ට හා මධ්‍යම කළමනාකරුවන්ට සංකල්පමය කුසලතා හා තාක්ෂණික කුසලතා සම සමව තිබිය යුතුය

25. එක්තරා ද්‍රව්‍ය අයිතමයකට අදාළ තොරතුරු කිහිපයක් පහත දක්වේ.

ද්‍රව්‍ය භාවිතය (පරිභෝජනය) මසකට ඒකක 600
ඒකකයක පිරිවැය රු 100
එක් ඇණවුමක් කිරීමේ පිරිවැය රු 200
ගබඩා කිරීමේ වාර්ෂික පිරිවැය - ඒකක පිරිවැයෙන් 2%
මෙම ද්‍රව්‍ය අයිතමයට අදාළ ආර්ථික ඇණවුම් ප්‍රමාණය

(1) ඒකක 7200 කි
(2) ඒකක 3600 කි
(3) ඒකක 2400 කි
(4) ඒකක 1200 කි
(5) ඒකක 600 කි

26. ව්‍යාපාරයක එක්තරා නිෂ්පාදිතයකට අදාළ වාර්ෂික අයවැය ගත තොරතුරු පහත දක්වේ.

විකුණුම් ඒකක 10, 000
ඒකකයක විකුණුම් මිල රු 50
ඒකක පිරිවැය

| | | |
|---|---|---|
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | රු. | 20 |
| සෘජු ශ්‍රම පිරිවැය | රු. | 10 |
| විචල්‍ය පොදු කාර්ය | රු. | 10 |
| ස්ථාවර පොදු කාර්ය | රු. | 05 |
| | රු. | 45 |

ඉහත නිෂ්පාදිතයේ සමච්ඡේදන ඒකක ප්‍රමාණය වනුයේ කුමක් ද?

(1) 10 000 (2) 8 000 (3) 5 000 (4) 2 500 (5) 1 250

27. ව්‍යාපාරයක ගබඩා කර ඇති එක්තරා ද්‍රව්‍ය අයිතමයකට අදාළ තොරතුරු කිහිපයක් පහත දක්වේ.

අවම ද්‍රව්‍ය භාවිතය - දිනකට ඒකක 120
උපරිම ද්‍රව්‍ය භාවිතය - දිනකට ඒකක 280
ඇණවුම් කාලය - අවම දින 20
ඇණවුම් කාලය - උපරිම දින 20
ආර්ථික ඇණවුම් ප්‍රමාණය ඒකක 5 000

මෙම අයිතමයට අදාළ උපරිම තොග මට්ටම කුමක් ද?

(1) 13 400 (2) 11 000 (3) 8 400 (4) 7 000 (5) 5 000

28. පහත සඳහන් වන්නේ නිෂ්පාදිතයක් වෙළෙඳපොළට ඉදිරිපත් කරන මට්ටම් කිහිපයකි.

A - අපේක්ෂිත නිෂ්පාදිතය
B - මූලික නිෂ්පාදිතය
C - හර ප්‍රතිලාභ නිෂ්පාදිතය
D - විභව නිෂ්පාදිතය
E - වර්ධිත නිෂ්පාදිතය

නිෂ්පාදිතයකට අදාළ ඉහත සඳහන් මට්ටම් අනුපිළිවෙලින් ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) ABCDE (2) BCDEA (3) CDABE (4) CBAED (5) DEABC

29. පහත "අ" කොටසේ දක්වෙන්නේ අලෙවිකරණ සංකල්පයන් වේ. "ආ" කොටසේ දක්වෙන්නේ අලෙවිකරණ සංකල්ප හා සම්බන්ධ විචල්‍යයන් වේ.

| "අ" | "ආ" |
|---|---|
| 1. නිෂ්පාදිත සංකල්පය | A - සමස්ත හා ඒකාබද්ධ අලෙවිකරණ වැඩ සටහන් කිරීමේ අවශ්‍යතාව |
| 2. සාක්‍යලවාදී අලෙවිකරණ සංකල්පය | B - පාරිභෝගික වුවමනා සොහා බලා ඒවා සපුරාලීම සඳහා නිෂ්පාදිත නිර්මාණය |
| 3. අලෙවිකරණ සංකල්පය | C - නිෂ්පාදිත සුලභකොට අඩු මිලකට බෙදා හැරීම |
| 4. විකුණුම් සංකල්පය | D - උසස් ගුණත්වයෙන් යුතු භාණ්ඩ නිපදවා සාධාරණ මිලකට සැපයීම |
| 5. නිෂ්පාදන සංකල්පය | E - විකුණුම් උපක්‍රම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම |

"අ" කොටසේ සඳහන් අලෙවිකරණ සංකල්ප "ආ" කොටසෙහි සඳහන් විචල්‍යයන් හා අනුපිළිවෙලින් ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) ABCDE (2) BCDEA (3) DABEC (4) CDEAB (5) EABCD

30. අ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර බලවේග ආශ්‍රයෙන් .............................. හා ........................... හඳුනා ගැනෙන අතර,

ආ) බාහිර පරිසර බලවේග ආශ්‍රයෙන් ................................... හා ................................... හඳුනා ගැනේ.

31. අ) හවුල් ව්‍යාපාරයක සෑම හවුල්කරුවෙකුම තමාගේ සහ සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු වීම හඳුන්වන්නේ .................................................. යනුවෙනි.

ආ) 2007 අංක 07 දරන සමාගම් පනත අනුව සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ප්‍රධාන ලියවිල්ල ...................................................... ලෙස හඳුන්වයි.

32. අ) ආයතනයක නිෂ්පාදන වල තත්ත්වය, ආරක්ෂාව සහ නිෂ්පාදන ගැටලු හඳුනා ගැනීමට සහ විසඳුම් යෝජනා කිරීම සඳහා නිතිපතා රැස්වන කුඩා සේවක කණ්ඩායම් ............................................ ලෙස හැඳින්වේ.

ආ) නිමැවුම් ව්‍යාපාරයක ගබඩා පිරිවැය අවම කර ගැනීම සඳහා භාවිත කරන ශිල්පීය ක්‍රමය .............................. ලෙස හැඳින්වේ.

33. විකුණුම්කරුවෙකු විකිණීමට ඉදිරිපත් කරන නිෂ්පාදිත කට්ටල i. ........................................... ලෙස හඳුන්වනු ලබන අතර එය කිසියම් ii. ....................................... ද iii. ............................................ ද iv. ....................... ...................................... ද සංගතතාවයකින් ද සමන්විත වේ.

34. අ) සමුපකාර සේවකයන්ගේ වැටුප් පරිමාණ නිර්දේශ කිරීමේ හා විනය කටයුතු සම්බන්ධ ක්‍රියා පටිපාටිය නියම කරන ආයතනය කුමක් ද? ..............................................................................

..............................................................................

ආ) සමුපකාර සමිති ලියාපදිංචිය පිළිබඳව කටයුතු කරන ආයතනය කුමක් ද? ..............................................................................

..............................................................................

35. සඵලදායි සන්නිවේදන ක්‍රමයක තිබිය යුතු ගුණාංග හතරක් නම් කරන්න.

1. ........................................ 2. ........................................


3. ........................................ 4. ........................................

36. අ) ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට ඇමරිකන් ඩොලර් 500 ක අවම තැන්පතුවකින් ආරම්භ කළ හැකි ගිණුම් වර්ගය කුමන නමකින් හැඳින්වේ ද? ..............................................................................


ආ) ශ්‍රී ලංකාවේ මුදල් නෝට්ටු වල අත්සන් දෙකක් දක්නට ලැබේ. එම අත්සන් තබන පුද්ගලයින්ගේ නිල නාමයන් සඳහන් කරන්න.

1. ........................................ 2. ........................................

37. පහත දැක්වෙන්නේ සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග දැක්වීමට යොදා ගන්නා සටහනකි. මෙම සටහනෙහි හිස්ව ඇති කොටු නිවැරදි පද භාවිත කරමින් සම්පූර්ණ කරන්න.




38. නිෂ්පාදන ක්‍රම 1, 2, 3 යන කොටුවලද , එක් එක් නිෂ්පාදන ක්‍රම වලට නිදසුන් x, y, z යන කොටුවල ද දැක්වෙන ආකාරයට පහත සටහන සම්පූර්ණ කරන්න.




39. කොටස් නිකුත් කිරීම සම්බන්ධයෙන් සහ කොටස් මත වූ ඇරයුම් සම්බන්ධයෙන් සමාගමට ලැබුණු හෝ ලැබිය යුතු සියලුම මුදල්වල එකතුව ........................................ ලෙස හඳුන්වයි.

40. හවුල් ව්‍යාපාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලපවත්නා නීතිය වන්නේ, ........................................ යි.

41. චෙක්පතකින් ගෙවන විට ගිණුම් හිමියාගේ අත්සන අවශ්‍ය නමුත් හරපතකින් ගෙවීමේ දී ගිණුම් හිමියාගේ .................................................................................... අවශ්‍ය වේ.

42. හානිපූර්ණ මූලධර්මය හා සම්බන්ධ වන අනුමූලධර්ම දෙක වනුයේ, .................................................................. හා .................................................................. ය.

43. ණයට විකුණන ලද භාණ්ඩ වෙනුවෙන් මුදල් එකතු කිරීමේ වගකීම භාරගන්නා නියෝජිතයා හඳුන්වනුයේ, .................................................................. ලෙස ය.

44. ලෝකයේ ආර්ථිකයන් අන්තර් රැඳියාවකින් යුත් තනි ආර්ථිකයක් ලෙස කටයුතු කිරීමේ ප්‍රවණතාව හඳුන්වන්නේ කවර නාමයකින් ද?

..................................................................................................................

45. මිහිකත සමුළුව යන කෙටි නාමයෙන් හඳුන්වනු ලබන ජාත්‍යන්තර සංවිධානය කුමක් ද?

..................................................................................................................

46. ශ්‍රී ලංකා රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති ආයතනය කුමක් ද?

..................................................................................................................

47. සීමාසහිත පොදු සමාගමක සාමාන්‍ය කොටස් හිමියෙකුට එම සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගි වන ලෙස ඇරයුමක් ලැබී තිබුණ ද ඊට සහභාගි වීමට ඔහුට අවකාශ නැත. එම රැස්වීමට ඔහු වෙනුවෙන් සහභාගි කරවිය හැකි නියෝජිතයා හැඳින්වෙන්නේ කිනම් නමකින් ද?

..................................................................................................................

48. ''හවුල් ව්‍යාපාරයක අනිවාර්යෙන් ගිවිසුමක් තිබිය යුතුය.'' මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද? (ඔව් / නැත) ..................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි]
All Right Reserved]

Learning Resource Centre

Business Studies Business Studies Business Studies Business Studies Business Studies Business Studies Business Studies Business Studies Business Studies

ද මැසනොද් විදුහල, කඳාන
De Mazonod Collage, Kandana

අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ
පළමු වාර පරීක්ෂණය - 2016

2016 A/L

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය II<br>*Business Studies II* | 13 ශ්‍රේණිය<br>*Grade 13* | කාලය<br>පැය 02 |

24/02/2016

## I කොටස

❖ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. (i) සමාජය තුළ ව්‍යාපාර විසින් වැදගත් භූමිකාවන් කිහිපයක් ඉටු කරනු ලැබේ.
   - අ) කාර්මික විප්ලවය හේතු කොටගෙන ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න.
   - ආ) ව්‍යාපාර විසින් සම්පූර්ණ කරනු ලබන විවිධ පුද්ගල අවශ්‍යතා මොනවා ද?

   (ii) ශ්‍රී ලංකාවේ පැරණි ආර්ථික ක්‍රියාවලිය තුළ කෘෂිකර්මාන්තය මූලික වුව ද, වර්තමානයේ කෘෂිකර්මාන්තයට අමතරව විවිධ වූ අංශ වෙත නැඹුරුවීමක් දක්නට ලැබේ.
   - අ) මෙම වත්මන් ප්‍රවණතාව සඳහා බලපාන හේතු හතරක් සඳහන් කරන්න.
   - ආ) 'වාණිජ්‍ය' හා 'ව්‍යාපාර' අතර ඇති සම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න.

   (iii) පහත දක්වෙන සංකල්ප යුගල අතර සමාන අසමානකම් විමසන්න.
   - අ) වෙළෙඳපොළ ස්ථානය (market place) හා වෙළෙඳපොළ අවකාශය (market space)
   - ආ) කල් පවතින භාණ්ඩ හා පහසු භාණ්ඩ

   (iv) ක්ෂණික ආහාර ව්‍යාපාරය (Fast food business) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශයන්හි ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වේ.
   - අ) ක්ෂණික ආහාර ව්‍යාපාරයේ සීඝ්‍ර වර්ධනයට බලපාන සාර්ව පාරිසරික සාධක මොනවා ද?
   - ආ) ක්ෂණික ආහාර ව්‍යාපාරය තුළ තම ගනුදෙනුකරුවන් ආකර්ශනය කර ගැනීම හා රඳවා ගැනීම කෙරෙහි හිතකර ලෙස බලපාන අභ්‍යන්තර පාරිසරික සාධක කෙටියෙන් පැහැදිලි කරන්න.

   (v) අ) ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇතැම් අංශවල ව්‍යාප්තියක් සමග සිදුවන ව්‍යාපාර ක්‍රියාකාරකම් මගින් සමාජයට හා ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශව වලට අහිතකර බලපෑම් ඇති වේ. එසේ අහිතකර බලපෑම් ඇති කරමින් ව්‍යාප්ත වන අංශ මොනවා දැයි කෙටියෙන් විස්තර කරන්න.
   - ආ) ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීම ආයතනයකට වැදගත් වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

02. (i) අ) චෙක්පතට සාමාන්‍ය රේඛනය යෙදීමට වඩා විශේෂ රේඛනය යෙදීමෙන් ලැබෙන ප්‍රතිඵල කවරේ ද?
   - ආ) ධාරක චෙක්පත හා විධාන චෙක්පත අතර කෙබඳු වෙනසක් ඔබ දකින්නේ ද?

   (ii) වර්තමානයේ විද්‍යුත් බැංකුකරණයේ (e-banking) සීඝ්‍ර ව්‍යාප්තියක් දකිය හැකිය. විද්‍යුත් බැංකුකරණ යටතට ගැනෙන ප්‍රධාන බැංකු කටයුතු දෙකක් නම් කර ඒවා පැහැදිලි කරන්න.

   (iii) අවදානම් ආවරණය කිරීමක් රක්ෂණයෙන් සිදු වේ. එසේ නම් ව්‍යාපාරිකයකුට ඕනෑම අවදානමක් රක්ෂණය කළ හැකි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

   (iv) වර්තමානයේ ඉලෙක්ට්‍රොනික් හා ඩිජිටල් තාක්ෂණය යටතේ බහුලව යොදා ගන්නා සන්නිවේදන ක්‍රම තුනක් නම් කර කෙටි හැඳින්වීමක් කරන්න.

   (v) අ) වෙළෙඳ කලාපයක් යනුවෙන් කුමක් අදහස් කෙරේ ද?
   - ආ) ලෝකයේ දැනට ක්‍රියාත්මකව පවතින වෙළෙඳ කලාප දෙකක් නම් කරන්න.
   - ඉ) වෙළෙඳ කලාප තුළින් සාමාජික රට වලට අත්වන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

   (vi) කාර්යාල ස්වයංක්‍රීය පද්ධති (OAS) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? ඒවා ව්‍යාපාර ආයතනයකට ප්‍රයෝජනවත් වන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

03. (i) "ව්‍යවසායකයා ව්‍යාපාරය තුළ නොව ව්‍යාපාරය මත (An entrepreneur should work on the business not in it) කටයුතු කළ යුතු ය"

(ii) පහත සඳහන් වන්නේ ව්‍යවසායකයින් තුළ පවත්නා පෞරුෂත්ව ගති ලක්ෂණ කිහිපයකි.

A - අභිලාෂය (Ambitions)
B - ස්වාධීන බව (Independent)
C - ධෛර්ය සම්පන්න බව (Passionate)
D - ආත්ම විශ්වාසය (Self-confident)
E - දැක්මක් සහිත බව (Visionary)
F - සුභවාදී බව (Optimistic)
G - පුද්ගල අභිමුඛ බව (People Oriented)

මේවා අතුරින් ඕනෑම හතරක් තෝරාගෙන ඒවායේ අර්ථය පැහැදිලි කරන්න.

(iii) ගනුදෙනු සඳහා විද්‍යුත් මුදල් (e-money) භාවිත කිරීමේ සීඝ්‍ර වර්ධනයක් වර්තමානයේ දැකිය හැකිය. ගනුදෙනු සඳහා භාවිතා වන විද්‍යුත් මුදල් නම් කරමින් මේවා ජනප්‍රිය වීමට හේතු පැහැදිලි කරන්න.

(iv) අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු අතර සැසඳීමක් කරන්න.
ආ) කල්බදු සමාගම් වලින් ව්‍යාපාරිකයින්ට ලබා ගත හැකි සේවාවන් සඳහන් කරන්න.

(v) අ) චෙක්පතක් රේඛනය කිරීමෙන් අණකරු අපේක්ෂා කරන්නේ කුමක් ද?
ආ) චෙක්පතක් පිටසන් කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? එහි අරමුණ ද පැහැදිලි කරන්න.

04. (i) අ) වගකීම් රක්ෂණය යනුවෙන් කුමක් අදහස් කෙරේ ද?
ආ) වගකීම් රක්ෂණ ඔප්පු වර්ග දෙකක් නම් කර පැහැදිලි කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ මහා මාර්ග ප්‍රවාහන පද්ධතියේ සහ දුම්රිය ප්‍රවාහන පද්ධතියේ කෙබඳු ප්‍රගතියක් මෑත කාලයේ දැකිය හැකි ද? සාකච්ඡා කරන්න.

(iii) සන්නිවේදනය සඳහා විද්‍යුත් තැපැල (e-mail) හා ජංගම දුරකථන (mobile phones) භාවිතය පුද්ගලයන් හා ව්‍යාපාරික ප්‍රජාව අතර බෙහෙවින් ජනප්‍රිය මාධ්‍ය බවට පත් වී තිබේ. මෙසේ ජනප්‍රිය වීමට හේතු පිළිබඳ විමසීමක් කරන්න.

(iv) "සිල්ලර වෙළෙඳාමේ දැකිය හැකි නව ප්‍රවණතාවකි, වෙළෙඳසැල් රහිත සිල්ලර වෙළෙඳාම" (Non store - Retailing) මෙය තුළ ක්‍රියාත්මක වන විවිධ ක්‍රම, නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(v) අ) ජාත්‍යන්තර වෙළෙඳාම තුළින් රටකට අත්කර ගත හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.
ආ) ජාත්‍යන්තර වෙළෙඳාමේ ව්‍යාප්තියට එරෙහි බාධා දෙකක් සඳහන් කරන්න.
ඉ) එම බාධා පිටු දැකීමට කටයුතු කරන ජාත්‍යන්තර ආයතන දෙකක් නම් කරන්න.
ඊ) ප්‍රධාන පෙළේ වෙළෙඳ කලාප (වෙළෙඳ හවුල්) දෙකක් නම් කරන්න.

05. (i) අ) පාරිභෝගික නිෂ්පාදිත හා කාර්මික නිෂ්පාදිතවල උප කොටස් වෙන වෙනම නම් කරන්න.
ආ) වර්ධිත නිෂ්පාදිතය (Augmented Product) යනු කුමක් ද?

(ii) සමාගමක අභ්‍යන්තර අරමුදල් සම්පාදන මාර්ග තුනක සඳහන් කර, ඒ එක් එක් මාර්ගයේ වාසි පැහැදිලි කරන්න.

(iii) අ) දළ කාරක ප්‍රාග්ධනය හා ශුද්ධ කාරක ප්‍රාග්ධනය යන සංකල්ප වෙන වෙනම පැහැදිලි කරන්න.
ආ) ව්‍යාපාරයක කාරක ප්‍රාග්ධනය වැඩි කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කවරේ ද?

(iv) අ) ආකර්ශනය හා තෝරා ගැනීම අතර දැකිය හැකි වෙනස්කම් කවරේ ද?
ආ) රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය එකිනෙකට සම්බන්ධ වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

(v) තනතුරකට ගැළපෙන පුද්ගලයෙකු බඳවා ගැනීම වැදගත් වන්නේ ඇයි? මේ තුළින් වැඩි ප්‍රතිලාභ ලැබෙන්නේ ආයතනයකට ද? සේවකයාට ද? පැහැදිලි කරන්න.

(vi) ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත විධායක සාරාංශයේ වැදගත්කම පැහැදිලි කරන්න. විධායක සාරාංශයක් ලිවීමේ දී සැලකිය යුතු කරුණු කවරේ ද?

06. (i) අ) නිෂ්පාදිතයක ගුණත්වය යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

ආ) පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.

1. සමස්ත ගුණත්ව කළමනාකරණය (TQM)
2. ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ)

(ii) පහත දක්වෙන අලෙවිකරණ හර සංකල්ප පැහැදිලි කරන්න.

1. වටිනාකම හා තෘප්තිය
2. හුවමාරුව හා ගනුදෙනු

(iii) වර්තමානයේ අලෙවිකරුවෝ ගනුදෙනුකරුවන්ට වැඩි වටිනාකමක් ලබා දීම සඳහා සිය නිෂ්පාදිත විවිධ මට්ටම් යටතේ වෙළෙඳපොළට ඉදිරිපත් කරයි. නිෂ්පාදිතයක් ඉදිරිපත් කෙරෙන විවිධ මට්ටම් අනුපිළිවෙලින් නම් කර, ඒවා වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න.

(iv) කෘෂිකර්ම ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් ඇති මහීපාල මහතා ගොයම් මැඩීම සඳහා නව යන්ත්‍රයක් නිර්මාණය කර ඇත. මෙම යන්ත්‍රයේ කාර්යක්ෂමතාව පිළිබඳව අදාළ කෘෂිකර්ම පර්යේෂණ ආයතනවල සහතිකකරණය ද ලැබී තිබේ. මෙම යන්ත්‍රය නිපදවා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට ඔහු සූදානමින් සිටී. මෙම යන්ත්‍රය වෙළෙඳපොළට හඳුන්වාදීමට සුදුසු ප්‍රවර්ධන උපකරණයක් ගැන ඔහු සලකා බලමින් සිටී.

ව්‍යාපාර අධ්‍යයනය හැදෑරූ ශිෂ්‍යයකු හැටියට මහීපාල මහතාගේ ගොයම් මැඩීමේ යන්ත්‍රය වෙළෙඳපොළට හඳුන්වාදීමට වඩාත් යෝග්‍ය ප්‍රවර්ධන උපකරණය නිර්දේශ කරන්න. ඔබ එම ප්‍රවර්ධන උපකරණය නිර්දේශ කිරීමට හේතු පැහැදිලි කරන්න.

(v) අ) ව්‍යාපාරයක කාරක ප්‍රාග්ධනය යනු කුමක් ද?

ආ) ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් නොමැති වීමෙන් ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල කවරේ ද?

ඉ) ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් නොමැති අවස්ථාවක එය වැඩි කර ගැනීම සඳහා ගත හැකි කෙටි කාලීන පියවර කවරේ ද?

## II කොටස

07. (i) විවිධ වර්ගයේ භූමිකා (Roles) තුළ කළමනාකරුවන් ඉටු කරන කටයුතු සහ ඒවාට නිදසුන් දක්වන්න. ඔබගේ පිළිතුර සඳහා පහත දක්වෙන ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න.

| භූමිකා (Roles) | කටයුතු | නිදසුන් |
|---|---|---|
| **අන්තර් පුද්ගල භූමිකා** | | |
| 1. .................... | .................... | .................... |
| 2. .................... | .................... | .................... |
| 3. .................... | .................... | .................... |
| **තොරතුරු භූමිකා** | | |
| 4. .................... | .................... | .................... |
| 5. .................... | .................... | .................... |
| 6. .................... | .................... | .................... |
| **තීරණ භූමිකා** | | |
| 7. .................... | .................... | .................... |
| 8. .................... | .................... | .................... |
| 9. .................... | .................... | .................... |
| 10. .................... | .................... | .................... |

08. (i) අ) තත්ත්ව පාලනය (Quality Control) අර්ථ දක්වා එමගින් ව්‍යාපාර ආයතනයකට ලැබෙන ප්‍රතිලාභ සඳහන් කරන්න.

ආ) පහත දැක්වෙන තත්ත්ව පාලන ශිල්ප ක්‍රම පැහැදිලි කරන්න.

1. තත්ත්ව කව (Quality Circles)
2. ශූන්‍ය දෝෂ (Zero Defects)

(ii) අ) 'අලෙවිකරණය' හැඳින්වීම සඳහා පිළිගත හැකි නිර්වචනයක් ඉදිරිපත් කරන්න.

ආ) අලෙවිකරණය විවිධ ආකාරයෙන් නිර්වචනය කළ හැකි වුව ද එය මූලික වශයෙන් රඳා පවතින්නේ 'හර සංකල්ප' (Core Concepts) මතය. මෙම හර සංකල්ප අනුපිළිවෙලට නම් කරන්න.

(iii) රංජිත් සහ සජිත් ව්‍යාපාරයක හවුල්කරුවෝය. ඔවුන්ගේ ව්‍යාපාරය වනුයේ ආපන ශාලාවක් (Restaurant) පවත්වාගෙන යාමයි. මෙම ව්‍යාපාරයේ සාර්ථකත්වයට ඉවහල් වන අලෙවිකරණ මිශ්‍රය (Marketing Mix) කෙබඳු විය යුතු ද? ඔබ සඳහන් කරන අලෙවිකරණ මිශ්‍රයේ ඇතුළත් විචල්‍යයන් එකිනෙකෙහි ඇති වැදගත්කම පෙන්නුම් කරන්න.

(iv) අ) 'ප්‍රචාරණයේ එකම අරමුණ වනුයේ භාණ්ඩ හා සේවා මිලට ගැනීමට පාරිභෝගිකයන් දිරි ගැන්වීම' (Reinforce) යැයි කෙනෙකු ප්‍රකාශ කළහොත් ඔබ එම ප්‍රකාශයට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

ආ) ශ්‍රී ලංකාවේ පාවහන් සඳහා වූ වෙළෙඳ පොළෙහි විවිධ ඛණ්ඩනයන් (Segments) දැකිය හැකි ය. මෙසේ පාවහන් වෙළෙඳපොළ ඛණ්ඩනය කිරීමට අලෙවිකරුවන් උපයෝගී කරගෙන තිබෙන පදනම් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(v) අ) මූල්‍ය කළමනාකරණයේ මූලික අරමුණු කවරේ ද?

ආ) මූල්‍ය කළමනාකරුවකු විසින් ගනු ලබන තීරණ ප්‍රධාන වශයෙන් ආයෝජන තීරණ සහ මූල්‍යන තීරණ යනුවෙන් කොටස් දෙකකට බෙදා දක්වේ. මෙම තීරණ දෙවර්ගය නිදසුන් සහිතව වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න.